7. (i) යටිතල පහසුකම් සැපයීමෙහි ලා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ හවුල්කාරීත්ව ක්‍රමය (Public Private Partnership) යනු කුමක් ද? එහි වාසි කවරේද ? (ලකුණු 04)

(ii) ''බදු අයකිරිමේ මූලිකම අරමුණ වන්නේ සම්පත් ඒකරාශී කිරීම වේ.'' බදු අයකිරීම තුළින් රජයක් අපේක්ෂා කරනු ලබන වෙනත් අරමුණු මොනවා ද? (ලකුණු 04)

(iii) ආර්ථික වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදමේ ප්‍රධාන සංරචක මොනවා ද? (ලකුණු 04)

(iv) කිසියම් වර්ෂයක් තුළ රාජ්‍ය අය වැයෙහි දත්ත කිහිපයක් පහත දැක්වේ. සියලුම සංඛ්‍යා රු. මිලියනවලිනි.

| | |
|---|---|
| රාජ්‍ය ආදායම | 15000 |
| පුනරාවර්තන වියදම | 18500 |
| රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීම් | 500 |
| ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් | 7500 |
| විදේශ ප්‍රදාන | 2000 |
| වර්තන සංක්‍රාම | 3000 |

ඉහත තොරතුරු යොදා ගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) වර්තන ගිණුමේ ශේෂය

(ආ) සමස්ත ශේෂය

(ඇ) ප්‍රාථමික ගිණුමේ ශේෂය

(ඉ) රාජ්‍ය පරිභෝජන වියදම (ලකුණු 04)

(v) රාජ්‍ය ණය තිරසාරභාවය යනු කුමක් ද? එය ඇගයීම සඳහා යොදා ගන්නා දර්ශකයන්ගේ මෑත කාලීන වෙනස්වීම් දක්වන්න. (ලකුණු 04)

8. (i) (අ) ජාත්‍යන්තර වෙළඳාමෙහි නිරපේක්ෂ වාසිය හා සාපේක්ෂ වාසිය අතර වෙනස පැහැදිළි කරන්න. (ලකුණු 03)

(ආ) සාපේක්ෂ වාසි න්‍යාය පදනම් වන්නේ කවර උපකල්පන මතද ? (ලකුණු 02)

(ii) (අ) ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා බාධක පැනවීමට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක මොනවාද ? (ලකුණු 02)

(ආ) තීරු බදු නොවන වෙළෙඳ බාධක කවරේ ද? (ලකුණු 02)

(iii) විදේශීය සෘජු ආයෝජන, කළඹ ආයෝජනවලට වඩා වැදගත් වන්නේ ඇයි ? (ලකුණු 04)

(iv) ගෙවුම් ශේෂ හිඟයක් දිගු කාලීනව පවතී නම් එය සමනය කිරීමට කරන යෝජනා කවරේද? (ලකුණු 03)

(v) ශ්‍රී ලංකාවේ විදේශ මුල්‍යයනයේ, විදේශ ණය පිළිබඳව මෑත කාලයේ හටගෙන ඇති වෙනස්කම් කවරේද ? (ලකුණු 04)

9. (i) (අ) ආර්ථික වෘද්ධියේ පිරිවැය කවරේද ? (ලකුණු 03)

(ආ) ආර්ථික සංවර්ධනය යන්නෙන් කුමක් අදහස් වේ ද ? (ලකුණු 04)

(ii) "මානව දරිද්‍රතාවයේ ප්‍රතිවිරුද්ධ අන්තය මානව සංවර්ධනය වේ". මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න. (ලකුණු 04)

(iii) (අ) මානව සංවර්ධන දර්ශකයේ ප්‍රධාන පැතිකඩ **තුන** කවරේ ද? (ලකුණු 03)

(ආ) බහුමාන දරිද්‍රතා දර්ශකය සකස් කිරීමේ දී යොදා ගැනෙන ප්‍රධාන විහීනතා කාණ්ඩ කවරේ ද? (ලකුණු 03)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආර්ථික විෂමතා අවම කිරීම සඳහා පසුගිය දශකය තුළ රජය ගනු ලැබූ ප්‍රයත්නයන් කවරේ ද? (ලකුණු 03)

10. (i) ශ්‍රී ලංකාවේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය මැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කරන දර්ශකය නම් කොට ගෙන 2011-2012 වර්ෂවල උපනතීන් පරීක්ෂා කරන්න. (ලකුණු 03)

(ii) 'මහින්ද චින්තන ඉදිරි දැක්ම' ආර්ථික ප්‍රතිපත්තිය 2020 දක්වා දිගු කරමින් ඉදිරිපත් වූ 'නොනවතින ශ්‍රී ලංකාව' (Unstoppable Sri Lanka 2020) වාර්තාවේ සඳහන් පරිදි 2020 වන විට ළඟා කර ගැනීමට අපේක්ෂිත ආර්ථික ඉලක්ක කවරේ ද? (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමෙහිලා ඉදිරිපත් කළ හැකි යෝජනා කවරේද? (ලකුණු 04)

(iv) සහස්‍ර සංවර්ධන අභිමතාර්ථයක් ලෙස දරිද්‍රතාව මුලිනුපුටා දැමීම සඳහා වූ ඉලක්කය ශ්‍රී ලංකාව විසින් කොතෙක් දුරට සාධනය කරගෙන තිබේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) 'දිවි නැගුම' වැඩ සටහනේ අරමුණු හා එහි වර්තමාන ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06)

* * *

www.artsapi.lk